ගැනුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පණවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අය බදු හෝ ගාස්තු අය කිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතු වේ.

වැඩි විස්තර සඳහා කරුණාකර ඩීඑෆ්සීසී බැංකුවේ නීති දෙපාර්තමේන්තුව අමතන්න. දුරකථන අංකය : 011-2440366/77.

ෂොක්මන් සහ සමරවික්‍රම,
රජයේ අනුමත හා එකම ISO 9001:2000 සහතිකය ලත්,
ශ්‍රී ලංකාවේ පිළිගත්, පුරෝගාමී වරලත් වෙන්දේසිකරුවෝ,
තක්සේරුකරුවෝ සහ දේපළ ඒජන්තවරු.

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර
දුරකථන අංකය : 081-2227593
දුරකථන/ෆැක්ස් අංකය : 081-2224371
ඊමේල් : schokmankandy@sltnet.lk

*නගර කාර්යාලය හා ප්‍රදර්ශනාගාරය :*
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 5.
දුරකථන අංක : 011-2502680, 011-2585408
දුරකථන/ෆැක්ස් අංකය : 011-2588176
ඊමේල් : schokman@samera1892.com

වෙබ් අඩවිය : www.schokmanandsamerawickreme.com

04-109

---

**ඩීඑෆ්සීසී බැංකුව**
(කලින් ශ්‍රී ලංකාවේ සංවර්ධන මූල්‍ය සංස්ථාව යනුවෙන් හඳුන්වන ලද)

1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙහි 8 වන වගන්තිය යටතේ වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

**අංක 1455 සහ 1596 දරන උකස්කරයන් යටතේ උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තර**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළේ, පල්ලේපත්තුවේ, කොළඹ මහ නගර සභා පරිපාලන සීමාවට අයත්, බම්බලපිටිය නාගරික කොට්ඨාස අංක 38, ශාන්ත අන්තෝනි පාර (කලින් කොල්ලුපිටිය පටුමග), අංක 70 (කොටසක්) යන ස්ථානයේ පිහිටා ඇති (බලයලත් මිනින්දෝරු පී. සින්නතම්බි විසින් සකසන ලද 1991 අප්‍රේල් මස 02 වැනි දිනැති අංක 3106 දරන පිඹුරු පතෙහි ලොට් අංක X1B හි නැවත මිනුමක් වන) ලොට් අංක X1B ලෙස සඳහන් ඉඩම

ඉඩමේ ප්‍රමාණය : අක්. 0 රූඩ් 1 පර්. 10.69
එහි පිහිටි මහල් ගොඩනැගිල්ල ද සමග

1. බලයලත් මිනින්දෝරු පී. සින්නතම්බි විසින් සකසන ලද 1992 සැප්තැම්බර් මස 18 දිනැති සභාධිපත්‍ය පිඹුරුපත් අංක 3695 හි පිහිටි කාමර ඒකක අංක G34 සමග, G34 ඒකකය යනු වෙළඳසැලකි. G 34 ඒකකයට ඉක්මන් පොදු ප්‍රවේශය CE 24 වේ.

2. සභාධිපත්‍ය පිඹුරු පත් අංක 3695 හි පිහිටි කාමර ඒකක අංක G 35 සමග, G 35 ඒකකය යනු වෙළඳසැලකි. G 35 ඒකකයට ඉක්මන් පොදු ප්‍රවේශය CE 24 වේ.

3. සභාධිපත්‍ය පිඹුරුපත් අංක 3695 හි පිහිටි කාමර ඒකක අංක G 33 සමග, G 33 ඒකකය යනු වෙළඳ සැලකි. G 33 ඒකකයට ඉක්මන් පොදු ප්‍රවේශය CE 24 වේ.

සභාධිපත්‍ය පිඹුරු පත් අංක 3695 හි නිරූපිත හා විස්තර කෙරෙන අනෙකුත් පොදු දේවල් ද සමග

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. එම්. ගුණරත්න විසින් ලියා සහතික කරන ලද, 2004 ජූලි මස 22 වැනි දින දාතමින් යුතු අංක 1455 දරන උකස්කරය සහ 2005 මැයි මස 04 වැනි දින දාතමින් යුතු අංක 1596 දරන උකස්කරය ප්‍රකාර ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි සහ එහි ලියාපදිංචි කාර්යාලය කොළඹ 03 පිහිටා ඇති සී/ස ප්‍රොෆ් කම්පියුටර්ස් (පෞද්ගලික) ආයතනය (මෙයින් පසු ආයතනය ලෙස දැක්වෙන) විසින් ඩී එෆ්. සී සී බැංකුවට උකස් කරන ලදුව, ගෙවීම්වල දී පොරොන්දු නිසියාකාර ව ඉෂ්ට නොකරන ලද දේපළ, ඩී එෆ් සී සී බැංකුව විසින් අප වෙත පවරන ලද බලය යටතේ අප විසින් 2009 අප්‍රේල් මස 29 වැනි දින (බදාදා) පෙ. ව. 11.00 ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය.-* මිළ තීන්දු වූ වහා ම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතුය :

1. ගැනුම් මිලෙන් 10% ක් (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. තින්දු වූ මිළෙන් 2 1/2% ක් වන වෙන්දේසිකරුගේ කොමිස් මුදල (සියයට දෙකහමාර),
4. රු. 28,500 ක් වන සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000.

ගැනුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පණවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අය බදු හෝ ගාස්තු අය කිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතු වේ.

වැඩි විස්තර සඳහා කරුණාකර ඩීඑෆ්සීසී බැංකුවේ නීති දෙපාර්තමේන්තුව අමතන්න. දුරකථන අංක : 011-2440366/77.

ෂොක්මන් සහ සමරවික්‍රම,
රජයේ අනුමත හා එකම ISO 9001:2000 සහතිකය ලත්,
ශ්‍රී ලංකාවේ පිළිගත්, පුරෝගාමී වරලත් වෙන්දේසිකරුවෝ,
තක්සේරුකරුවෝ සහ දේපළ ඒජන්තවරු.

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර
දුරකථන අංකය : 081-2227593
දුරකථන/ෆැක්ස් අංකය : 081-2224371
ඊමේල් : schokmankandy@sltnet.lk

*නගර කාර්යාලය හා ප්‍රදර්ශනාගාරය :*
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 5.
දුරකථන අංක : 011-2502680, 011-2585408
දුරකථන/ෆැක්ස් අංකය : 011-2588176
ඊමේල් : schokman@samera1892.com

වෙබ් අඩවිය : www.schokmanandsamerawickreme.com

04-110

මහජන බැංකුව- නුගේගොඩ නගර ශාඛාව

1986 අංක 32 පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

බස්නාහිර පළාතේ. කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ කොළඹ මහ නගර සභාවේ තිඹිරිගස්යායේ පිහිටියාවූ ද දැන් නාගරික කොට්ඨාස අංක 41 කිරුළ කොට්ඨාසයේ පයිප් පාරේ වරිපනම් අංක 77 දරන්නාවූ ද, දෙල්ගහවත්ත යයි කියනු ලබන ඉඩමේ බලයලත් මිනින්දෝරු එම්. එන්. ආර්. ප්‍රේමරත්න විසින් සාදන ලද අංක 36 හා 1988.07.05 දින දරන පිඹුරේ ලොට් අංක ඒ 2 ලෙස ලකුණු කොට නිරූපනය කර ඇත්තාවූ ද පර්චස් දහතුනයි දශම හතයි දෙකක් (අක්. 0 රූඩ්. 0 පර්. 13.72) විශාල වූ ද, බෙදා වෙන් කරන ලද මුළු ඉඩම් කොටස සහ එහි පිහිටි ගොඩනැගිලි , ගහකොළ, වැව්ලි සහ වෙනත් සියලු දේත් ය. එකී අංක 36 දරන පිඹුරේ ලොට් ඒ 3 ලෙස ලකුණුකළ අඩි 10 ක් පළල පාර සඳහා වෙන් කළ බිම් තීරයේ මාර්ග අයිතිය ද මීට ඇතුළත් ය. කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ. 1107/163 යටතේ ලියාපදිංචි කර ඇත.

ප්‍රමාණයෙන් (අ. 0 රූඩ්. 0 පර්. 13.72)

මහජන බැංකුවෙන් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් 2009 මැයි මස 04 වැනි දින පෙ. ව. 10.30 ට දේපල පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*රජයේ ගැසට් පත්‍රයේ* 2009.10.24 වැනි දින ද, දිනමිණ හා ඩේලිනිවුස් පුවත්පත්වල 2009.12.04 වැනි දින ද, පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම.* -තිඹිරිගස්යාය හන්දියේ සිට නාරාහේන්පිට දෙසට ඇති පාරේ මීටර් 400ක් පමණ ගිය පසු දකුණු පැත්තේ ඇති පයිප් පාරේ මීටර් 200ක් පමණ ගියපසු මෙම දේපල පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.*- වෙන්දේසිය අවසන් වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

1. ගැණුම් මිලෙන් 10% ක්,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට විකුණුම් මිලෙන් 1%ක්,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක්,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500ක්,
5. විකුණුම් වියදම් සහ වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත නුගේගොඩ ස්ටැන්ලි තිලකරත්න මාවතේ අංක 102, මහජන බැංකුවේ ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයේ ප්‍රාදේශීය කළමණාකරු වෙත ගෙවිය යුතුය. දුරකථන අංක 2854189, 2811007, 2825101 ෆැක්ස් අංකය 2768018.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාළ විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැක. ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මිලෙන් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපල විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ඒ. එස්. ලියනගේ - සා.වි.,
උසාවි කොමසාරිස්, වෙන්දේසිකරු,
තක්සේරුකරු සහ දිවුරුම්ලත් භාෂා පරිවර්තක.

අංක 228/ඒ,
වලව්වත්ත, කැස්බෑව,
දුරකථන අංක : 2703478, 0777-459823.

04-117

ඩීඑෆ්සීසී බැංකුව
(කලින් ශ්‍රී ලංකාවේ සංවර්ධන මූල්‍ය සංස්ථාව යනුවෙන් හඳුන්වන)

1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙහි 8 වන වගන්තිය යටතේ වටිනා දේපළ සහ යන්ත්‍රෝපකණ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

**අංක 312 දරන උකස්කරය යටතේ උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තර**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ ගම්පහ දිස්ත්‍රික් සංවර්ධන සභාවේ (DDC Gampaha) අංක 02 හැඳල උප කාර්යාල බල ප්‍රදේශය ඇතුළත, හැඳල කෙරවළපිටිය, ග්‍රාමයේ පිහිටි බලයලත් මිනින්දෝරු ඒ. ඩබ්ලිව්. තිලකරත්න විසින් මැන සාදන ලද 1989 ජුනි මස 15 වැනි දිනැති අංක 104ඒ දරන පිඹුරු පතෙහි ලොට් අංක 294 ලෙස දක්වා ඇති සීමා නිර්ණය කර බෙදා වෙන් කරන ලද ඉඩම.

ඉඩමේ ප්‍රමාණය : අක්. 01, රූඩ් 01, පර්. 07

පහත සඳහන් ඉඩම් හරහා වැටී ඇති මාර්ග අයිතිය ද සමග :

1. ඉහත සඳහන් හැඳල කෙරවළපිටිය ග්‍රාමයේ පිහිටි බලයලත් මිනින්දෝරු ඒ. ඩබ්. තිලකරත්න විසින් මැන සාදන ලද 1989 ජුනි මස 15 වැනි දිනැති අංක 104 ඒ දරන පිඹුරු පතෙහි ලොට් අංක 290 ලෙස දක්වා ඇති සීමා නිර්ණය කර බෙදා වෙන් කරන ලද ඉඩම.

ඉඩමේ ප්‍රමාණය : අක්. 02, රූඩ් 01, පර්. 03

2. ඉහත සඳහන් හැඳල කෙරවළපිටිය ග්‍රාමයේ පිහිටි බලයලත් මිනින්දෝරු ඒ. ඩබ්. තිලකරත්න විසින් මැන සාදන ලද 1989 ජුනි මස 15 වැනි දිනැති අංක 104 ඒ දරන පිඹුරු පතෙහි ලොට් අංක 37 ලෙස දක්වා ඇති සීමා නිර්ණය කර බෙදා වෙන් කරන ලද ඉඩම.

ඉඩමේ ප්‍රමාණය අක්. 01, රූඩ් 0 පර්. 05

අංක 311 දරන උකස්කරය යටතේ උකස් කරන ලද යන්ත්‍රෝපකරණ පිළිබඳ විස්තර :

මෙහි පහත සඳහන් යන්ත්‍රෝපකරණ ඇතුලුව, සියලු චංචල පිරියත, යන්ත්‍රසූත්‍ර හා උපකරණ

**විස්තර**

කොන්ස්ටන්ටා ටී බැගිං මැෂින් ඊඑන්වී ටැග් - 1168
කොන්ස්ටන්ටා ටී බැගිං මැෂින් ඊඑන්වී ටැග් - 1001
කොන්ස්ටන්ටා ටී බැගිං මැෂින් ඊඑන්වී ටැග් - 1168 සඳහා නිර්දේශිත පරිවර්තන කට්ටලය
කොන්ස්ටන්ටා ටී බැගිං මැෂින් ඊඑන්වී ටැග් - 1001 සඳහා නිර්දේශිත පරිවර්තන කට්ටලය

අමතර කොටස් සහ උපාංග ද සමග

අංක 228 දරන උකස්කරය යටතේ උකස් කරන ලද යන්ත්‍රෝපකරණ පිළිබඳ විස්තර :

පහත විස්තර කරන පිරියත, යන්ත්‍ර සූත්‍ර හා උපකරණ ඇතුලුව සියලු චංචල යන්ත්‍රෝපකරණ.

| *විස්තරය* | *ප්‍රමාණය* |
|---|---|
| නියුමැටික් වෙස්ට ටිපර් විත් එයාර් කම්ප්‍රෙසර්, 10 ෆීට් පවර් කන්වේයර් විත් 1 එච් පී මෝටර් ගියර් බොක්ස් | 01 |
| බෙල්ට් කන්වේයර් - 1 විත් ටිපින් හොපර් ෆීටඩ් විත් පර්මනන්ට් ග්‍රීඩ් ඇන්ඩ් බාර් මැග්නට්ස් විත් 1 එච් පි මෝටර් ගියර් බොක්ස් | 01 |
| ස්ටෙයින්ලස් ස්ටීල් වයිබ්‍රේටර් ශිෆ්ටර් විත් ටූ ලේයර් ඉන්ටර්චේන්ජබල් මෙෂ් ෆැසිලිටි විත් 3 එ් පි මෝටර් | 01 |
| බකට් එලිවේටර් විත් ෆයිබර් ග්ලාස් බකට්ස් (2 HP මෝටර්) | 01 |
| බ්ලෙන්ඩ් ඩ්‍රම් ඇන්ඩ් ස්ටෝරේජ් හොපර් බෝත් මේඩ් අවුට් ඔෆ් ස්ටෙයින් ලස් ස්ටීල් AISI 304 ග්‍රේඩ් ඩ්‍රිවන් බයි 5 එච් පී බ්‍රේක් මෝටර් ඇන්ඩ් ගියර් බොක්ස් විත් මෝටර්යිස්ඩ් ඔපරේෂන් ඔෆ් ෆිඩින් ඇන්ඩ් ඩිස්චාජ් සිස්ටම් විත් 0.5 එච් පී x 5 මෝටර්ස් | 01 |
| ඩස්ට් එක්ස්ට්‍රැක්ටර් කන්ෆයින්ඩ් ටූ ද සිස්ටම් විත් මෝටර් 10 x 1 එච් පී | 01 |
| කන්ට්‍රෝල් පැනල් | 01 |
| රොටරි ඩ්‍රම් මැග්නටික් සෙපරේටර් විත් බෙල්ට් කන්වේයර් - 2 විත් ෆීඩ් වුඩ් ඇන්ඩ් 2 (1 x 1 ) එච් පී මෝටර් ගියර් බොක්ස් | 01 |
| කම්ප්ලීට් මැනුෆැක්චරින් ඇන්ඩ් සප්ලයි ඔෆ් ඩිස්ටෝනිං ප්ලාන්ට්, කන්සිස්ටින් ඔෆ් එයාර් ලිෆ්ට් | 01 |
| ඩක්ට්, ස්ටෙයින් ලස් ස්ටිල් සයික්ලෝන් සෙපරේටර් විත් රොටරි එයාර් ලොක් විත් 30 එච් පී මෝටර් | 02 |
| කම්ප්ලීට් මැනුෆැක්චරින් ඇන්ඩ් සප්ලයි ඔෆ් එම් එස් ෆැබ්රිකේටඩ් බකට් එලිවේටර් ෆෝ ලිෆ්ටින්ග් බ්ලෙන්ඩඩ් ටී ෆ්‍රොම් බ්ලෙන්ඩින්ග් ඩ්‍රම් ටූ සෙපරේටර් ස්ටෝරේජ් සිලෝ ෆෝ බෝත් සයිඩ් ඩිස්චාජ් | 02 |
| කම්ප්ලීට් මැනුෆැක්චරින් ඇන්ඩ් සප්ලයි ඔෆ් 2 එස් එස් 1000kg කැපැසිටි ස්ටෝරේජ් සිලෝ ෆො ස්ටෝරින්ග් ඔෆ් බ්ලෙන්ඩඩ් ටිස් ටූ පැක් ඉන් බල්ක් ෆ්‍රොම් ෆෝ ඩිලිවරි මවුත්ස් විත් ස්ට්‍රක්චරල් ස්ටෑන්ඩ් ඇන්ඩ් මේන්ටෙනන්ස් ප්ලැට්ෆෝම් ස්ටෙයාකේස් ඔන්ලයින් වේ ෆිලිං ෆො පේපර් සැක්/බෑග්/චෙස්ට්ස් ෆ්‍රොම් 30kg ටු 60kg | 04 |

අමතර කොටස් සහ උපාංග සහිතව කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩී. ජී. හේවාවිතාරණ විසින් ලියා සහතික කරන ලද, 2004 මාර්තු මස 15 වැනි දින දාතමින් යුතු අංක 228 දරන උකස්කරය ප්‍රකාර, ප්‍රසිද්ධ නොතාරිස් ඩී. ජී. හේවාවිතාරණ විසින් ලියා සහතික කරන ලද, 2004 දෙසැම්බර් මස 28 වැනි දින දාතමින් යුතු අංක 312 දරන උකස්කරය ප්‍රකාර, ප්‍රසිද්ධ නොතාරිස් ඩී. ජී. හේවාවිතාරණ විසින් ලියා සහතික කරන ලද 2004 දෙසැම්බර් මස 28 වැනි දින දාතමින් යුතු අංක 311 දරන උකස්කරය ප්‍රකාර ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදි සමාජවාදි ජනරජයේ 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි සමාගමක් වන සහ කොළඹ 03, ශාන්ත අන්තෝනි මාවත, ලකී ප්ලාසා, 2 වන මහල, අංක 70 යන ලිපිනයේ ලියාපදිංචි කාර්යාලය පිහිටි (මෙහි මින්මතු සමාගම යනුවෙන් සඳහන් කරනු ලබන) සි/ස ස්ටෑන්ඩර්ඩ් ට්‍රේඩිං (පෞද්ගලික) සමාගම විසින් ඩී එෆ් සී සී බැංකුවට උකස් කරන ලදුව, ගෙවීම්වල දී පොරොන්දු නිසියාකාර ව ඉෂ්ට නොකරන ලද දේපළ, ඩී එෆ් සී සී බැංකුව විසින් අප වෙත පවරන ලද බලය යටතේ අප විසින් 2009 අප්‍රේල් මස 22 වැනි දින (බදාදා) පෙ. ව. 11.30 ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය.*- මිළ තීන්දු වූ වහා ම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතුය :

1. ගැණුම් මිලෙන් 10% ක් (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල (සියයට දෙකහමාර),
4. රු. 62,500 ක් වන සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000,

ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පණවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අය බදු හෝ ගාස්තු අය කිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතු වේ.

වැඩි විස්තර සඳහා කරුණාකර ඩීඑෆ්සීසී බැංකුවේ නීති දෙපාර්තමේන්තුව අමතන්න. දුරකථන අංක : 011-2440366/77.

ෂොක්මන් සහ සමරවික්‍රම,
රජයේ අනුමත හා එකම ISO 9001:2000 සහතිකය ලත්,
ශ්‍රී ලංකාවේ පිළිගත්, පුරෝගාමී වරලත් වෙන්දේසිකරුවෝ,
තක්සේරුකරුවෝ සහ දේපළ ඒජන්තවරු.

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංකය : 081-2227593,
දුරකථන/ෆැක්ස් අංකය : 081-2224371.
ඊමේල් : schokmankandy@sltnet.lk

*නගර කාර්යාලය හා ප්‍රදර්ශනාගාරය :*
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 5.
දුරකථන අංක : 011-2502680, 2585408,
දුරකථන/ෆැක්ස් අංකය : 011-2588176.
ඊමේල් : schokman@samera1892.com

වෙබ් අඩවිය : www.schokmanandsamerawickreme.com

04-107

## මහජන බැංකුව -වැල්ලවත්ත ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

බණ්ඩාරගම, මහබෙල්ලන ගමේ පිහිටි ප්‍රමාණයෙන් අක්කර බින්දුවයි රූඩ් බින්දුවයි පර්චස් දහනමයයි දශම තුනයි බින්දුවක් (අ. 0 රූ. 0 පර්. 19.30) ක් විශාල ඉඩම සහ එහි තුළ පිහිටි සියලුම දේ.

මහජන බැංකුවෙන් මා වෙත පවරන ලද බලය මත මා විසින් වර්ෂ 2009ක් වූ අප්‍රේල් මස 25 වැනි දින පෙ. ව. 11.30 ට දේපල පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වැඩි විස්තර සඳහා.-2003.06.06 වැනි දින රජයේ *ගැසට් පත්‍රයේ* ද, 2003.05.28 වැනි දින දිනමිණ, ඩේලි නිව්ස් සහ තිනකරන් යන පුවත්පත් වල පල කර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම.* - බණ්ඩාරගම පානදුර මාර්ගයේ මහබෙල්ලන හන්දියෙන් වමට ඇති ගඟ පාරේ මීටර් 100ක් යන විට දකුණට ඇති මහවත්ත පාරේ සැතපුමක් පමණ යන විට හමුවන තුංමන් හන්දියෙන් වමට මීටර් 200ක් පමණ ගිය විට පාරේ දකුණු පස පොදු ළිඳක් හමු වේ. එම ළිඳට යාබද ව මෙම දේපල පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

1. ගැණුම් මිළෙන් 10%ක්,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1%ක්,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිළෙන් 2 1/2%ක්,
4. ලිපිකරු හා නිවේදක ගාස්තු වශයෙන් රු. 500ක්,
5. විකුණුම් වියදම් සමඟ වෙනත් ගාස්තු වෙතොත් එම මුදල්,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිළෙන් ඉතිරි 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත කොළඹ 1, අංක 11, ආදිපාද වීදියේ. මහජන බැංකුවේ සහකාර සාමාන්‍යාධිකාරී වෙත ගෙවිය යුතුය. හිමිකම් ඔප්පු සහ වෙනත් අදාළ විස්තර ඉහත ලිපිනයෙන් ලබාගත හැක.

දුරකථන අංක 2393678, 2387068 ෆැක්ස් අංකය 2435977.

ඉහත සඳහන් මුදල් දින 30ක් ඇතුළත නොගෙව්වහොත් ගෙවා ඇති 10%ක් වූ මුදල ආපසු නොගෙවීමට හා නැවත දේපල විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ඒ. එස්. රාමනායක,
උසාවි කොමසාරිස් බලයලත් වෙන්දේසිකරු
සහ තක්සේරුකරු.
මුළු දිවයිනටම සාම විනිසුරු.

*කාර්යාලය :*
අංක 25 බී, බෙල්මන්ට් විදිය, කොළඹ 12
දුරකථන අංක : 011-5756356

*නිවස :*
අංක 11/55, කුඩාබුත්ගමුව, අංගොඩ,
දුරකථන අංක : 011-2419126.

04-162

## ලංකා බැංකුව

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 22 වැනි වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

ණය ගැණුම්කරු : මහරගම, පමුණුව පාර, නිව් සිසිර මහල්, අංක 67 හි පිහිටි සී/ස වූරි පැනල් (පුද්ගලික) සමාගම

ලංකා බැංකු ආඥාපනතේ 19 වෙනි වගන්තිය යටතේ ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2009.02.06 දිනැති අංක 1588 දරන *ගැසට් පත්‍රයේ* හා 2009.01.29 දිනැති දිනමිණ, තිනකරන් හා ඩේලිනිවුස් යන පුවත්පත්වල පල කරන ලද යෝජනාවකට අනුකූලව එකී ආඥාපනතේ අංක 26 දරන වගන්තිය යටතේ අයකර ගත හැකි මුල් මුදලේ ශේෂය ද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොලිය ද, ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපල, පරිශ්‍ර සහ යන්ත්‍ර සූත්‍ර පිහිටි ස්ථානයේදීම 2009.05.06 වැනි දින පෙ. ව. 10.00 ට කොළොන්නාව, විහාර මාවත. අංක 50/3 හි පදිංචි වෙන්දේසිකාර T & H වෙන්දේසිකාර මහතුන් විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

### දේපල පිළිබඳ විස්තරය

බස්නාහිර පළාතේ, කලුතර දිස්ත්‍රික්කයේ, රයිගම් කෝරළේ, උඩගහපත්තුවේ, බොරළුගොඩ ග්‍රාමයේ පිහිටි 'වෝල්ටර් ලැන්ඩ් එස්ටේට්' නැමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු එෆ්. සී. ඩී. හෙට්ටිආරච්චි විසින් සාදන ලද 1995 පෙබරවාරි 23 දිනැති අංක 2365 දරන පිඹුරෙහි ලොට් X ලෙස දක්වා විස්තර කර ඇති බෙදූ ඉඩම් කැබැල්ලට එනම් එකී ලොට් X ට උතුරට : එම ඉඩමේම ඉතිරි කොටසද, නැගෙනහිරට : එම ඉඩමේම ඉතිරි කොටස ( A. M. B. ගාමන්ට් ෆැක්ටරි සහ පරිශ්‍රය) ද, දකුණට: පානදුර සිට රත්නපුර දක්වා වූ මහ පාර ද, බස්නාහිරට : එම ඉඩමේම ඉතිරි කොටස සහ එම ඉඩමේම කොටස ද (විකුණූ) මායිම්ව අක්කර හතක (අ.7, රූ.0 පර්. 0) බිම් ප්‍රමාණයෙන් යුක්තවන අතර එකී අංක 2365 දරන පිඹුර ප්‍රකාර එහි ඇති ගොඩනැගිලි සහ සියළු දේ ද අයත්වේ. මෙය හොරණ ඉඩම් ලියාපදිංචි කරීමේ කාර්යාලයේ ඊ 145/145 හි ලියාපදිංචි කර ඇති අතර, හොරණ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ 167/37 හි ද ලියාපදිංචි කර ඇත.

ඉහත විස්තර කර ඇති භූමියේ හා පරිශ්‍රයේ සවිකර ඇති යන්ත්‍රෝපකරණ අතර අඩංගු,

1. E.P.S. Sandwich Panel Manufacturing Plant 01 No.
   Make - Manufactured by Jung Sim C & C Co. Ltd, Korea
   Date of Manufacture 2002

   Specification of Main equipment of the plant 01 No.
   (i) Uncoiling Machine
   (ii) Corrugated Sheet Forming Machine - 01 No.
   (iii) EPS Feeding and Panel Forming Machine - 01No.
   (iv) Laminator - 01 No.
   (v) Panel Cutting Machine - 01 No.
   (vi) Roller Conveyor - 01 No.
   (vii) Auto Stacker - 01 No.

2. "Tempest' AC Generator - 58kVA - 01 No.
   Make: ''Tempest', England
   Capacity: 58 kVA
   Engine: Make: Perkins
   Engine No.3777E066B1/2/BAF/I9/81

එම භූමියෙහි සවිකර ඇති සියළු වර්ගයේ සහ ඕනෑම ආකාරයක අනෙකුත් සියළුදේ ද ඉහත විස්තර කර ඇති සියලු දේද වේ.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. ඩබ්. වෙලගෙදර,
ප්‍රධාන කළමනාකරු.

අධිශ්‍රේණි ශාඛාව,
නුගේගොඩ.

04-148

---

## ලංකා බැංකුව

### ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 22 වැනි වගන්තිය හා එහි සංශෝධන යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

ලංකා බැංකු ආඥාපනතේ 19 වෙනි වගන්තිය යටතේ ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2009.01.23 දිනැති අංක 1586 දරන ගැසට් පත්‍රයේ හා 2009.01.15 දිනැති ඩේලිනිවුස්, දිනමිණ, තිනකරන් යන පුවත්පත්වල පල කරන ලද යෝජනාවකට අනුකූලව එකී ආඥාපනතේ අංක 26 දරන වගන්තිය යටතේ අයකර ගත හැකි මුල් මුදලේ ශේෂය ද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොලිය ද, ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපල හා පරිශ්‍ර පිහිටි ස්ථානයේදීම 2009.05.16 වැනි දින පෙ. ව. 11.30 ට කෝට්ටේ, පිටකෝට්ටේ, අංක 474, මහානාම ඩ්‍රයිව් හි පදිංචි වෙන්දේසිකාර ආර්. එස්. මහානාම මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා සීමාව තුළ, වෝඩ් අංක 9, කොච්චිකඩේ දකුණ, පරණයොන් වීදියෙහි පිහිටි බලයලත් මිනින්දෝරු එෆ්. රෙයිමන්ස් විසින් සාදන ලද 1825 පෙබරවාරි 10 දිනැති මැණුමෙහි කලින් වරිපනම් අංක 116 (සහ අංක 110) සහ දැනට පරණයොන් වීදියෙහි වරිපනම් අංක 84 දරන එකී ඉඩම උතුරටඃ පරණයොන් වීදිය ද, නැගෙනහිරටඃ උදුමා ලෙබ්බේ මරික්කාර් සේකදි මරික්කාර්ට අයිති වත්තද, දකුණට ඃ උදුමා ලෙබ්බේ මෙස්රියාට අයිති වත්තද, බස්නාහිරට ඃ අබ්දුල්පුල්ලේ මීරා නතීජාට අයත් නිවෙස ද මායිම්ව ප්‍රමාණයෙන් පර්චස් පහයි සියයෙන් පහකින් ද, (අ.0, රූ.0, පර්. 5 5/100) ද, සමන්විත වන අතර, ඊට අයත් සියළු දේද වේ. මෙයි කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයෙහි ඒ 1065/155 යටතේ ලියාපදිංචි කර ඇත.

එකී ඉඩම් කැබැල්ල බලයලත් මිනින්දෝරු කේ. මසිලාමණී විසින් සාදන ලද අංක 262 සහ 1986 ජනවාරි 27 දිනැති පිඹුරට අනුව පහත ආකාරයට විස්තර කර ඇත.

ඉහත කී කොච්චිකඩේ දකුණ, පරණයොන් වීදියෙහි පිහිටි පරණයොන් වීදියෙහි කලින් වරිපනම් අංක 116 සහ 110 දරන ලද, වරිපනම් අංක 84 දරන අංක 262 දරන පිඹුරෙහි 'ඒ' වශයෙන් දක්වා ඇති බෙදූ ඉඩම් කැබැල්ල උතුරට ඃ පරණයොන් වීදියද, නැගෙනහිරටඃ පරණයොන් වීදියේ වරිනම් අංක 88 දරන පරිශ්‍රයද, දකුණටඃ පරණයොන් වීදියෙහි වරිපනම් අංක 80 දරන පරිශ්‍රය ද, බස්නාහිරට ඃපරණයොන් වීදියෙහි වරිපනම් අංක 82 දරන පරිශ්‍රය ද, මායිම්ව ප්‍රමාණයෙන් පර්චස් අටයි දශම පහයි තුන (අ.0, රූ.0, පර්. 8.53) කින් සමන්විත වන අතර, එකී අංක 262 දරන පිඹුර ප්‍රකාර එහි ඇති ගහකොළ, වැවිලි, ගොඩනැගිලි හා සියලු දේද අයත්වේ.

ඩී. කේ. එස්. මහින්ද,
ශාඛා කළමනාකරු.

ලංකා බැංකුව,
මධ්‍යම වෙළඳපොල ශාඛාව.

04-152

---

## වයඹ සංවර්ධන බැංකුව - මුන්දලම ශාඛාව

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දකුණු කල්පිටිය ප්‍රදේශයේ කිල් අක්කරෙයිපත්තුවේ වටවන්හි පිහිටි "කත්තයන් වෙන්නායි" නමැති රජයේ ඉඩම විශාලත්වය අක්කර 02, රූඩ් 01 පර්චස් 9.32 ක් විශාල ඉඩම හා ඊට අයත් සියලුම දේත් සමඟ එහි පිහිටි නිවස යන මෙකී දේපල පුත්තලම ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ Q 114/226 යටතේ ලියාපදිංචි වී ඇත.

වයඹ සංවර්ධන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් 2009.04.30 වැනි දින පෙ. ව. 11.00 ට දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වැඩි විස්තර සඳහා.- 2008.03.14 දින රජයේ ගැසට් පත්‍රයද, 2008.10.03 දින දිනමිණ සහ ඩේලි නිවුස් පුවත් පත්වල ද, 2008.10.06 දින තිනකරන් පුවත්පතේ පළ කර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට ද අවධානය යොමු කරන්න.

*දේපලට පිවිසීම.*- මුන්දලම නගරයේ සිට පුත්තලම මහා මාර්ගයේ කි. මී. 6 ක් මංගලඑළිය හන්දිය දක්වා ගොස් වමට හැරී සින්නපාඩු පාරේ. කී. මී. 31/2 ක් ගිය විට කොන්තන්තිවු හන්දිය හමුවේ. එතැනින් වමට හැරී බොරළු පාරක් දිගේ කි. මී. 1 ක් පමණ ගොස් දකුණට හැරී එම පාරේම මීටර් 300 ක් පමණ ගොස් වමට ඇති බොරළු පාරේ කි. මී. 2 1/2 ක් පමණ ගිය විට බේබි ජීසස් හා පල්ලිය හමුවේ. එතැනින් දකුණට හැරී එම පාරේම මීටර් 250 ක් පමණ ගොස් දකුණට හැරී මීටර් 50 ක් පමණ ගිය විට මෙම දේපල හමුවේ.

*ගෙවීමේ ක්‍රමය.*- වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කල යුතුයඃ-

1. ගැණුම් මිළෙන් 25% ක්,
2. වෙන්දේසිකරුගේ කොමිස් ගාස්තු 2 1/2% ක්,
3. රජයට ගෙවිය යුතු බද්ද සඳහා 1% ක්,
4. වෙන්දේසියට වැයවූ අනෙකුත් ගාස්තු ද,
5. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි 75% ක මුදල වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත වයඹ සංවර්ධන බැංකුව, අංක 155, මීගමු පාර, කුරුණෑගල වෙත ගෙවිය යුතුය.

*වැඩි විස්තර සඳහා විමසන්න* :- වයඹ සංවර්ධන බැංකුව, අංක 155, මීගමු පාර, කුරුණෑගල.

*දුරකථන අංක* :- 037-227428/037-227429/037-2227567/37-2231880.

ඩබ්. පී. සී. පෙරේරා,
බලයලත් වෙන්දේසිකරු හා උසාවි කොමසාරිස්.

අංක 22,
ප්‍රනාන්දු මාවත,
මීගමුව.

04-135

---

## ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ දී පැවැත්වෙන බස්නාහිර පළාතේ වාණිජ මහාධිකරණයේ දී ය

කොළඹ 1, බ්‍රිස්ටන් වීදියේ අංක 21 දරන ස්ථානයේ 'විදේශ ශාඛාව' යනුවෙන් හැඳින්වෙන ශාඛා කාර්යාලයක් සහ/හෝ ව්‍යාපාරික ස්ථානයක් ඇත්තාවූ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හෙවත් සීමාසහිත ලංකා වාණිජ බැංකුව

නඩු අංකය:
42/2004 (1)

*පැමිණිලිකරු* ............................

එදිරිව

හෝමාගම, කටුවන, නාගරික සංවර්ධන අධිකාරියේ කර්මාන්ත පුරයේ අංක 94 දරන ස්ථානයේ 'වර්ණ ඇසෝෂියේට්ස්' යන ව්‍යාවහාර ව්‍යාපාර නාමය යටතේ ව්‍යාපාරයෙහි යෙදී සිටින

1. නලින් සනත් කුමාර වර්ණකුලසූරිය
2. උඩුවිදානෙලාගේ සුදර්මා ප්‍රියන්ති පෙරේරා

*විත්තිකරුවන්*............................

ඉහත සඳහන් නඩුවේ මා වෙත නිකුත් කර ඇති විකිණීමේ නියෝගය අනුව පැමිණිල්ලේ වාසියට 01 වන සහ 02 වන විත්තිකරුවන් ට එරෙහිව පහත සඳහන් දෑ සඳහා එක්ව සහ වෙන් වෙන් ව එකී නඩු තීන්දුව ප්‍රකාර,

1. රු. 1,939,730 ක මුදලක් සහ රු. 402,879.26ක් ද යනුවෙන් එකතුව රු. 2,342,609.26ක් වන්නාවූ මුදලක් ද එකී රු. 1,939,730 ක මුදල මත 2003.10.21 වැනි දින සිට සම්පූර්ණ මුදල ගෙවා නිම කරන තෙක් වර්ෂයකට 21% බැගින් පොලිය ද,

2. රු. 5,266,981ක මුදලක් සහ රු. 1,093,944.73ක් ද යනුවෙන් එකතුව රු. 6,360,925.73ක් වන්නාවූ මුදලක් ද, එකී රු. 5,266.981 ක මුදල මත 2003.10.21 වැනි දින සිට සම්පූර්ණ මුදල ගෙවා නිම කරන තෙක් වර්ෂයකට 21% බැගින් පොලිය ද,

*(ආ)* අධිකරණ නිලධාරියෙකු විසින් තක්සේරු කරනු ලබන නඩු ගාස්තු ද දෙන ලෙස, සහ
*(ඇ)* මෙහි උපලේඛනයේ විස්තර කර ඇති එකී ඉඩම් මත බඳු, බදුකර අයිතිවාසිකම් ඉහත කී මුදල් ප්‍රමාණයක් ගෙවීම සඳහා බන්ධනය වී ඇති බවට සහ ඇස්කිසි කළ හැකි බවට ගරු අධිකරණය විසින් අණ කොට තීන්දු ප්‍රකාශ කරනු ලැබේ.

වර්ෂ 2007ක් වූ ජූලි මස 17 වැනි දින කොළඹ වාණිජ මහාධිකරණ නඩු තීන්දු ප්‍රකාශයට ඉටු කිරීමට ඉහත කී විත්තිකරුවන් අපොහොසත් වී ඇති බැවින් පහත උපලේඛන වල සවිස්තරාත්මකව දක්වා ඇති දේපල වල බදුකර අයිතිය එම දේපල පිහිටි ස්ථානයේ දී වර්ෂ 2009ක් වූ අප්‍රේල් මස 24 වැනි දින ප. ව. 2.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරළයේ පල්ලේ පත්තුවේ හෝමාගම උපදිසාපති කොට්ඨාසය ඇතුළත හෝමාගම පිහිටි මිල්ලගහවත්ත යනුවෙන් හැඳින්වෙන මිණුම්පති විසින් සත්‍යවත් කරන ලද අංක සී ඕ 7284 සහ 1996 පෙබරවාරි මස 5 වැනි දින දරන මූලික සැලැස්මේ අංක 1 බිම් කැබැල්ල වශයෙන් දක්වා ඇති බෙදා වෙන් කොට සීමා නිර්ණය කර ඇති බිම් කොටස තුළ මත සහ ඔස්සේ ඇති බදුකර අයිතිවාසිකම් එහි පිහිටි සියල්ල සහිතව කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙලුම/පත්‍රිරුව ජී 1268/64 යටතේ ලියාපදිංචි කර ඇති එකී අංක සී ඕ 7284 දරන මූලික සැලැස්ම අනුව එකී අංක 1 බිම් කැබැල්ලට මායිම් උතුරට : අංක සී ඕ 6996 දරන මූලික සැලැස්මේ අංක 73 සහ 90 දරන බිම් කැබලි, නැගෙනහිරට : අංක සී ඕ 6996 දරන මූලික සැලැස්මේ අංක 90 දරන බිම් කැබැල්ල සහ අංක 2 දරන බිම් කැබැල්ල, දකුණට : ලොට් අංක 2 සහ බස්නාහිරට : අංක සී ඕ 6996 දරන මූලික සැලැස්මේ අංක 94 දරන බිම් කැබැල්ල සහ එහි ප්‍රමාණය හෙක්ටයාර් බින්දුවයි දශම එකයි බින්දුවයි බින්දුවයි එක (හෙක්. 0.1001)ක් වේ.

2. එකී හෝමාගම පිහිටි මිල්ලගහවත්ත යනුවෙන් හැඳින්වෙන ඉඩමේ මිණුම්පති විසින් සත්‍යවත් කරන ලද අංක සී ඕ 7284 සහ 1996 පෙබරවාරි මස 5 වැනි දින දරන මූලික සැලැස්මේ අංක 2 යනුවෙන් ලකුණු කර ඇති බෙදා වෙන් කොට නිර්ණය කර ඇති ඉඩම තුළ, මත සහ ඔස්සේ ඇති බදුකර අයිතිවාසිකම් සහ එහි පිහිටා ඇති සියලු දේ සහිතවයි. කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙලුම/පත්‍රිරුව ජී 1268/65 යටතේ ලියාපදිංචි කර ඇති එකී අංක සී ඕ 7284 දරන මූලික සැලැස්මට අනුව එකී අංක 1 බිම් කැබැල්ලට මායිම් උතුරට: අංක සී ඕ 6996 දරන මූලික සැලැස්මේ අංක 1 සහ 90 දරන බිම් කැබලි, නැගෙනහිරට : අංක සී ඕ 6996 දරන මූලික සැලැස්මේ අංක 90 දරන බිම් කැබැල්ල සහ අංක 3 බිම් කැබැල්ල, දකුණට : අංක 3, 6 සහ 7 දරන බිම් කැබලි සහ බස්නාහිරට : අංක සී ඕ 6996 දරන මූලික සැලැස්මේ අංක 94 දරන බිම් කැබැල්ල සහ එහි ප්‍රමාණය හෙක්ටයාර් බින්දුවයි දශම බින්දුවයි නමයයි හතයි හතර (හෙක්. 0.0974)ක් වේ.

*ඉඩමට පිවිසීම.* - හෝමාගම නගරයේ සිට කිරිවත්තුඩුව ප්‍රධාන මාර්ගයේ මීටර් 900ක් පමණ ඉදිරියට ගියවිට හමුවන කටුවන හංදියේ වම්පසට වන්නට ඇති කටුවන කර්මාන්තපුරය පාරේ මීටර් 400ක් පමණ ගිය විට දකුණු පසට වන්නට අංක 94 ඒ දරන මෙම විෂය වස්තුව හමුවේ.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසන් වූ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීමේ වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුය. චෙක්පත් බාරගනු නොලැබේ.

1. ගැණුම්කරු විසින් විකුණුම් මිලෙන් 25%
2. සියලුම ප්‍රචාරක වියදම්,
3. වෙන්දේසිකරුගේ ගාස්තු 2.5%,
4. රජයේ ගාස්තු,
3. ලිපිකරු සහ සෝෂක ගාස්තු 2,500.

ඉතිරි 75% ක මුදල් දින 30ක් ඇතුළත දී කොළඹ වාණිජ මහාධිකරණයේ තැන්පත් කළ යුතුය. ඔප්පු පරික්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න.

කේ. ආර්. මහාවිතාන,
තක්සේරුකරු, වෙන්දේසිකරු සහ උසාවි කොමසාරිස්,
අංක 156-1/13 අලුත්කඩේ වීදිය,
කොළඹ 12.
දුරකථන අංකය : 0773681839.

කළමණාකරු (අයකිරීම්),
කොමර්ෂල් බැංකුව,
අංක 21, බ්‍රිස්ටල් වීදිය,
කොළඹ 01,
දුරකථන අංකය : 011-2447167.

04-105

---

## නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී.එල්.සී. (කලින් නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් ලිමිටඩ්)

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධාවිධාන) පනතේ 9 වන වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ සියනෑ කෝරළයේ අදිකාරි පත්තුවේ සූරියපාලුව පිහිටි දෙල්ගහවත්ත ගෝන්ගහවත්ත නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. බී. ජයසේකර විසින් මැන සාදන ලද අංක 126 5 4 සහ 2003.07.25 දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ ලොට් 1ඒ (බලයලත් මිනින්දෝරු වී. එෆ්. ජේ. පෙරේරා විසින් මැන සාදන ලද අංක 3947 සහ 1968.02.04 දින දරන පිඹුරේ ලොට් 1 හි අනුබෙදීමක් වන) දරන බිම් කොටස ප්‍රමාණය අ. 0, රූ. 0, පර්. 12 (ඊට අයත් ගොඩනැගිලි ගහකොළ පළතුරු ආදී සියළු දේත් සමගය) තව ද, 126 5 4 දරන පිඹුරේ ලොට් 1 සී ලෙස නිරූපිත බිම් කට්ටිය මතින් ගමන් කිරීමේ මාර්ග අයිතිය ද සමග වේ.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් දේව මනෝහරන් ස්වාමිනාදන් විසින් ලියා සහතික කරන ලද අංක 6377 සහ 2005 අප්‍රේල් මස 21 දින දරන උකස් බැඳුම්කරය මගින් ප්‍රධාන ණයකරුවන් වශයෙන් කසකාර දේවාල අන්නක්කගේ සාලිය රොෂාන් පුෂ්පකුමාර සහ දඩයක්කාර දේවගේ සමීරා මහේෂනී කොතලාවල යන අය විසින් ලබාගන්නා ලද මූල්‍ය පහසුකම් නිසි පරිදි ආපසු ගෙවීම සඳහා ඇපයක් වශයෙන් කඩවත, සූරිගම, දිසාගේවත්තේ, අංක 201/09, දරන ස්ථානයේ පදිංචි දඩයක්කාර දේවගේ සමීරා මහේෂනී කොතලාවල විසින් (කලින් කොළඹ 01, යෝර්ක් වීදියේ අංක 76 දරන ස්ථානයේ පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් ලිමිටඩ් වශයෙන් හඳුන්වනු ලැබූ) කොළඹ 02, යූනියන් පෙදෙසේ, අංක 242 දරන ස්ථානයේ පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. නමට උකසට තබා ඇති අයිතිවාසිකම් දේපල සහ පරිශ්‍රය එකී ප්‍රධාන ණයකරුවන් විසින් ගෙවීම් පැහැර ඇති හෙයින්, නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. විසින් අප වෙත පවරා ඇති බලය ප්‍රකාරව 2009ක් වූ අප්‍රේල් මස 28 වැනි දින පෙ. ව. 10.00ට ඉහත සඳහන් දේපල අප විසින් එම ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2009.01.09 වැනි දින රජයේ ගැසට් පත්‍රය ද 2009.02.10 වන දින දිවයින, ද අයිලන්ඩ් සහ තිණකුරල් පුවත්පත් ද බලන්න.

*දේපලට පිවිසීම.*-කොළඹ සිට නුවර පාරේ කඩවතට පැමිණ එතැනින් වමට ගණේමුල්ල පාරේ ඉදිරියට කිලෝ මීටර් 3 ගමන් කළ විට හමුවන 3 නේ කණුව අසලින් දකුණට හැරී බතහේන පාරේ මීටර් 600 ඉදිරියට ගිය විට හමුවන වංගුවෙන් වමට ඇති ගුරු පාරේ (මීටර් 50 පමණ වංගුවෙන් ඉදිරියට) මීටර් 75 පමණ ගමන් කල විට අදාළ දේපල වම් පසින් පිහිටා ඇත.

*ගෙවීම් කළයුතු ආකාරය.*- විකිණීම ස්ථිරකල වහාම සාර්ථක ගැණුම්කරු විසින් මිටිය පහත හෙලූ විගස පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත අත්පිට මුදලින් ගෙවිය යුතුයි.

01. ගැණුම් මිලෙන් සියයට දහයක් (10%),
02. ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනූව 90% විකිණීමේ දින සිට දින 30ක් තුල දී නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. හි ප්‍රධාන කාර්යාලයේ තැන්පත් කළ යුතුයි,
03. පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (1%),
04. වෙන්දේසිකරුගේ වෘත්තීය ගාස්තු තීන්දු වූ මිලෙන් සියයට දෙකයි දශම පහක් (2.5%),
05. බැංකුව විසින් දරන ලද සියළුම ප්‍රචාරන සහ අනෙකුත් වියදම්
06. ලිපිකරු හා සෝෂක වේතන රු. 500,
07. නොතාරිස් ගාස්තු විකිණුම් කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2000.

හිමිකම් ඔප්පු පරික්ෂාව සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න. කළමනාකරු පාරිභෝගික නීති කටයුතු, නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී.,අංක 242, යූනියන් පෙදෙස, කොළඹ 2.

දුරකථන අංක : 0114-6 82403, 077-3918733.

ත්‍රිවංක සහ සේනානායක වෙන්දේසිකරුවෝ,
බලයලත් වෙන්දේසිකරුවෝ,
තක්සේරුකරුවෝ සහ උසාවි කොමසාරිස්වරු,
කොළඹ වාණිජ මහාධිකරණය සහ
දිසා අධිකරණය, බලයලත් වෙන්දේසිකරුවෝ
රාජ්‍ය සහ වාණිජ බැංකු.

04-157

## සෙලාන් බැංකුව පීඑල්සී - කටුනේරිය ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ විකිණීම

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, දකුණු පිටිගල් කෝරළේ, මැද පළාත පලුවෙල්ගල ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු එම්. ජේ. ගෝමස් විසින් සාදන ලද 2001.08.01 දිනැති අංක 4820 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන නාගහවත්ත නැමැති ඉඩමේ ලොට් 01 දරන බෙදූ ඉඩම් කොටස ප්‍රමාණයෙන් පර්චස් දහ අටයි දශම නවයක් (අ. 0 රූ. 0 පර්. 18.9) විශාල එහි පිහිටි සියලු දේ සමග ඉඩම. මෙය මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්‍රිරුව ජේ 110/95 හි ලියාපදිංචි කර ඇත.

ඉහත සඳහන් දේපළ 2009 මැයි මස 05 වැනි දින පස්වරු 3.30 ට එම දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මෙම දේපළ ඉහල කොත්තරමුල්ල පදිංචි ජයසිංහ මුදලිගේ සංජීවනී හේෂානි සහ ජයසූරිය ආරච්චිලාගේ තරිඳු බාෂුරා මධුෂංක යන අය බන්ධනදායි වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

*දේපළට පිවිසීම.-* කටුනේරියේ සිට දංකොටුව මාර්ගයේ විත් නාත්තන්ඩිය පාරට සම්බන්ධ වී 13 වන කි. මී. කණුව පසුකර මීටර් 300ක් පමණ ඉදිරියට ගිය විට ඇති පලුවෙල්ගල පාරට හැරී ගිය විට ඇති කොත්තරමුල්ල පාරේ තවත් කි. මී. 2.1ක් පමණ ඉදිරියට ගිය විට පාරේ වම්පස අදාළ දේපළ පිහිටා ඇත.

යෝජනා සම්මුති දැන්වීම *රජයේ ගැසට් පත්‍රයේ* 2008.12.05 වැනි දින පළ වී ඇති අතර ඩේලිමිරර් සහ ලංකාදීප පුවත්පතේ 2008.11.29 සහ වීරකේසරී පත්‍රයේ 2008.12.29 දින ද පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% වන පළාත් අධිකාරි බද්ද (සියයට එකක්), 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්), 4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000, 5. ලිපිකරු සහ සෝෂක වේතන රු. 500, 6. සියලුම ප්‍රචාරක වියදම් ද ගැණුම් මිලෙන් ඉතිරි 90% ද විකිණීමේ දින සිට දින 30ක් ඇතුලත සෙලාන් බැංකුව පීඑල්සී වෙත ගෙවා නිම කළ යුතුය.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. සහකාර සාමාන්‍යාධිකාරී (නීති) සෙලාන් බැංකුව පීඑල්සී, අංක 90, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංකඃ 011-2456285, 2456263, 2456284.

තුසිත කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස්.

ටී ඇන්ඩ් එච්. ඔක්ෂන්,
අංක 50/3, විහාර මාවත, කොලොන්නාව.
දුරකථන අංක :011-2696155, 011-2572940.

04-164

## පැන් ඒෂියා බැංකින් කෝපරේෂන් පීඑල්සී

1990 අංක 4 දරන බැංකු විසින් ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ දේපළ වෙන්දේසිය

බැංකුවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව පහත දැක්වෙන දේපළ 2009 අප්‍රේල් මස 20 වන දින ප. ව. 1.30 ට දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළම මහනගර සීමාව තුළ මට්ටක්කුලිය කොට්ඨාස අංක 1 හි පල්ලිය පාරේ පිහිටා තිබෙන වරිපනම් අංක 55/20 සහ දැනට වරිපනම් අංක 55/20ඒ දරන (බලයලත් මිනින්දෝරු ඩී. සී. කොතලාවල විසින් මැන සාදන ලද අංක 2611 සහ 1983/03/08 දිනැති සැලැස්මේ දැක්වෙන විස්ට්වයික් නමැති ඉඩමේ කොටසක් වන ලොට් 1 දරන කැබැල්ලේ නැවත මැන අනුබෙදන ලද කොටසක් වන) බලයලත් මිනින්දෝරු එම්. ඩී. එන්. ටී. පෙරේරා විසින් මැන සාදන ලද අංක 3706 සහ 2005.03.19 දින දරන සැලැස්මේ ලොට් 1 බී බිම් කැබැල්ල වශයෙන් ලකුණු කර බෙදා වෙන්කොට සීමා නිර්ණය කර ඇති ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි සහ සියලු දේ සමඟ වේ. එකී 3706 දරන සැලැස්මේ ලොට් 1සී මත මාර්ග අයිතිය ද සමඟින් වේ.

ප්‍රමාණය (අ.0, රූ.0, පර්. 6.15)

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ජේ. ආර්. දොලවත්තගේ විසින් සහතික කරන ලද අංක 2136 සහ 2006.07.21 අංක 2463 සහ 2007.09.13 සහ අංක 2545 සහ 2007.12.12 දිනැති උකස්කරයන් මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් දසනායක මුදියන්සේලාගේ ලලිත් පුෂ්පකුමාර දසනායක සහ ලොකු විජේසිංහලාගේ නිල්මිණි සුරංගි විජේසිංහ යන අය බන්ධනදායින් වශයෙන් සහ ලොකු විජේසිංහලාගේ නිල්මිණී සුරංගි විජේසිංහ උකස්කරු වශයෙන් උකස් කරන ලද දේපළ.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය- සඳහා 2009.03.26 වන දින ඩේලි නිවුස්, ලක්බිම, සුඩර් ඕලි පුවත් පත් සහ 2009.03.27 වන දින *ගැසට් පත්‍ර* බලන්න.

*දේපළට පිවිසෙන මාර්ගය.-* මට්ටක්කුලිය මැද පාර සහ ශාන්ත මරියා පාර හන්දියෙන් ශාන්ත මරියා පාර දිගේ පල්ලිය පාර දෙසට මීටර් 200 ක් පමණ ගමන් කොට ශාන්ත මරියා පාර අවසානයේ දී දකුණු පසට හැරී පල්ලිය පාර දිගේ මීටර් 50 ක් ගොස් නැවතත් දකුණට හැරී අඩි 20 ක් පළල පාර දිගේ මීටර් 75 ක් පමණ ගිය විට විකිණීමට නියමිත ඉඩම දකුණු පැත්තේ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.-* වෙන්දේසිය අවසාන වූ විගස ගැණුම්කරු එවලේම පහත සඳහන් මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය :-

1. ගැණුම් මුදල් 10% ද (සියයට දහයක්),
2. පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1% ද (සියයට එකයි) සහ වැට් බද්ද ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. විකිණීමේ සම්පූර්ණ ගාස්තුව හා අනෙකුත් ගාස්තු ද,

වෙන්දේසි දිනයේ සිට වැඩ කරන දින 30 ක් ඇතුළත ගැණුම් මිලේ පරිශේෂ වන 90% ක මුදල බැංකුවට ගෙවිය යුතුය.

අදාල ඔප්පු හා අනෙකුත් ලියවිලි පරීක්ෂා කිරීම සහ වෙනත් අදාළ තොරතුරු ජ්‍යෙෂ්ඨ කළමණාකරු - නීති, පැන් ඒෂියා බැංකින් කෝපරේෂන්

පී. එල්. සී. ප්‍රධාන කාර්යාලය, අංක 450, ගාලු පාර, කොළඹ 03. දුරකථන අංක : 2565573/2565565.

පී. කේ. ඊ. සේනාපති,
උසාවි කොමසාරිස්,
තක්සේරුකරු හා බලයලත් වෙන්දේසිකරු.

අංක 134, බැද්දගාන පාර,
කෝට්ටේ.
දුරකථන අංක : 2873656, 0777-672082, ෆැක්ස් : 2871184.

04-160/6

---

## මහජන බැංකුව - මූලස්ථාන ශාඛාව සහ කෑගල්ල ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, පරනකුරු කෝරලේ, මාවත පත්තුවේ, කෑගල්ල නගර සභා සීමාව තුළ කොට්ඨාශ අංක 3 සහ 1 හි පිහිටි බලයලත් මිනින්දෝරු ආර්. කනගරත්නම් මහතා විසින් මැන සාදන ලද අංක 891/කේපී දරන පිඹුර ප්‍රකාර කැබලි අංක 1 සහ 3 හි බෙදා වෙන් කරන ලද වටිනාකමින් යුත් බටේහේන සහ මුතුපෝරුවේ හේන නොහොත් පොඩියා හිටිය වත්ත නැමැති ඉඩමෙන් ප්‍රමාණයෙන් අ.0, රූ.1, පර්. 23 ක් සහ අ.0, රූ.0, පර්. 5 ක් විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි සියලු දේද වේ.

මහජන බැංකුවෙන් මා වෙත් පවරන ලද බලය මත මා විසින් වර්ෂ 2009 ක්වූ අප්‍රියෙල් මස 26 වන දින පෙ. ව. 11.30 ට දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*වැඩි විස්තර සඳහා.-* රජයේ ගැසට් පත්‍රයේ 2000.11.24 වන දිනද, 2000.11.15 වන දින දිනමිණ, ඬේලිනිවුස් සහ තිනකරන් පුවත්පත්වල පළ කර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම.-* සබරගමුව පළාතේ, කෑගල්ල ශාන්ත ජෝශප් විද්‍යාලයේ සිට යාර පනහක් පමණ කොළඹ දෙසට යන විට සමුපකාර සංගමයේ පිරවුම් මධ්‍යස්ථානය හමුවේ. මෙය ඉදිරිපිට පැරණි ටාර්සන් බස් සමාගමට අයත් ගොඩනැගිල්ල හමුවේ. කැබලි අංක 1 මෙයට යා බඳව ද, කැබලි අංක 3 පිහිටියේ කැබලි අංක 1 ට පිටුපස වේ.

*ගෙවීමේ ක්‍රමය.-* වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

1. ගැණුම් මිලෙන් 10% ක්,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1% ක්ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2% ක්ද,
4. ලිපිකරු සහ නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500 ක්ද,
5. විකුණුම් වියදම් සමග වෙනත් ගාස්තු වෙතොත් එම මුදල් ද,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක්වූ මුදල විකුණුම් දින සිට දින 30 ක් ඇතුළත මහජන බැංකුව, කලාප කාර්යාලයේ (බටහිර 01) සහකාර සාමාන්‍යාධිකාරී අංක 11, ඩියුක් වීදිය, කොළඹ 01 යන ලිපිනයට ගෙවිය යුතුය.

*දුරකථන අංක :* 2387068, 2393678 සහ 2344985.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාළ විස්තර ඉහත ලිපිනයෙන් ලබා ගත හැකිය.

ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30 ක් ඇතුළත නොගෙව්වහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මුදලින් 10% ක්වූ මුදල ආපසු නොගෙවීමට සහ දේපල විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ඊ. එස්. රාමනායක,
උසාවි කොමසාරිස්, බලයලත් වෙන්දේසිකරු
සහ තක්සේරුකරු, සාම විනිසුරු (මුළු දිවයිනටම).

*කාර්යාලය :* අංක 25 බී,
බෙල්මන්ට් වීදිය,
කොළඹ 12
දුරකථනය අංක : 011 - 5756356

*නිවස :* අංක 11/55, කුඩාබුත්ගමුව,
අංගොඩ.
දුරකථනය අංක : 011-2419126.

04-161

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
## සංශෝධිත ගාස්තු

2009 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2009 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 00 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 00 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 1,300 00 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 00 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ ගැසට් පත්‍රයේ සෑම කොටසක ම කෙළවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. **2009 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

*** ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)**

| | *වාර්ෂික දායක මුදල* | *තැපැල් ගාස්තුව* |
|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 2,080 00 | 3,120 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 1,300 00 | 3,120 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 780 00 | 3,120 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I. II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... ... | 4,160 00 | 6,240 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... | 580 00 | 3,120 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... | 405 00 | 3,120 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 890 00 | 2,400 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 860 00 | 420 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 260 00 | 180 00 |
| අති විශෙෂ ගැසට් පත්‍රය ... ... ... ... ... ... ... ... | 5,145 00 | 5,520 00 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොළස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

*** තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)**

| | **පිටපතක මිළ** | **තැපැල් ගාස්තුව** |
|---|---|---|
| I වැනි කොටස : | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 00 | 60 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 00 | 60 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 00 | 120 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 00 | 60 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... | 123 00 | 60 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... | 87 00 | 60 00 |

* කොළඹ 05, කිරුළපන, මායා මාවතේ, අංක 132 හි ප්‍රකාශන කාර්යංශයේ තනිපිටපත් විකිණීම සහ දායක මුදල් භාර ගැනීමේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙනන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවාත් හැර එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා රජයේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියලු ම දායක මුදල් කොළඹ 05, කිරුළපන, මායා මාවතේ අංක 132 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත නොව රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

**උපලේඛනය**

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2009** | | | |
| අප්‍රේල් | 2009.04.03 | සිකුරාදා | 2009.03.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2009.04.08 | බදාදා | 2009.03.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2009.04.17 | සිකුරාදා | 2009.04.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2009.04.24 | සිකුරාදා | 2009.04.08 | බදාදා | දහවල් | 12.00 |
| | 2009.04.30 | බ්‍රහස්පතින්දා | 2009.04.17 | සිකුරාදා | දහවල් | 12.00 |
| මැයි | 2009.05.07 | බ්‍රහස්පතින්දා | 2009.04.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2009.05.15 | සිකුරාදා | 2009.04.30 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2009.05.22 | සිකුරාදා | 2009.05.07 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2009.05.29 | සිකුරාදා | 2009.05.15 | සිකුරාදා | දහවල් | 12.00 |
| ජුනි | 2009.06.05 | සිකුරාදා | 2009.05.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2009.06.12 | සිකුරාදා | 2009.05.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2009.06.19 | සිකුරාදා | 2009.06.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2009.06.26 | සිකුරාදා | 2009.06.12 | සිකුරාදා | දහවල් | 12.00 |

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2009 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.